පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
PROVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES - NORTH CENTRAL PROVINCE
372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 025 - 2234673 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 025 - 2224173 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 025 -2225316 |
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | NCP/SS/E1/5(II) | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017/10/31 |


පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2017

උතුරු මැද පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියලුම සංවර්ධන සහකාර නිලධාරීන්/සංවර්ධන නිලධාරීන් වෙත.

<u>නිවුන්දරු මාසික ආධාර මුදල වැඩි කිරීම</u>

දරු උපතකදී නිවුන් දරුවන් ලැබීම විශේෂිත වූ තත්ත්වයක් වන අතර, තුන් නිවුන් දරුවන් ලැබීම නිවුන් දරුවන් ලැබීමේ තත්ත්වයටද එහා ගිය සුවිශේෂී දුර්ලභ තත්ත්වයකි. එවන් අවස්ථාවක දරුවන්ගේ යහපත් ශරීර සෞඛ්‍ය තත්ත්වය සහ නිසි පෝෂණ තත්ත්වය පවත්වාගෙන යාම සහ ඔවුන් රැකබලා ගැනීම පවත්නා සමාජ ආර්ථික ප්‍රශ්න හමුවේ කුඩු මහත් සියළු දෙනාටම පොදු වූ ගැටළුවක් වීම නිසා එම තත්ත්වයන් සුවිශේෂී වීම හේතු කොටගෙන නිවුන් දරු උපතකදී මා පියන්ගේ ආදායම් තත්ත්වය නොසලකා හැර මෙම දෙපාර්තමේන්තුව යටතේ මාසිකව ගෙවනු ලබන නිවුන්දරු ආධාර මුදල වැඩි කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව 2018 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි මේ වන විට ගෙවනු ලැබූ නිවුන්දරු ආධාර මුදල පහත පරිදි වැඩි කිරීමට තීරණය කර ඇත.

| අනු අංකය | දැනට ගෙවනු ලබන ආධාර මුදල | සංශෝධිත ආධාර මුදල | ගෙවනු ලබන ආකාරය |
|---|---|---|---|
| 01. | නිවුන්දරු උපතක් සඳහා මාසිකව රු. 1,000/- | නිවුන් දරු උපතක් සඳහා මාසිකව රු. 2,000/- | දරුවන්ට වයස අවුරුදු තුන වන තෙක් මාසිකව ගෙවිය යුතුය. |
| 02. | තුන් නිවුන් දරු හෝ ඊට වැඩි දරු උපතක් සඳහා මාසිකව රු. 1,500/- | තුන් නිවුන් දරු උපතක් සඳහා මාසිකව රු. 3,500/- | |
| 03. | | තුන් නිවුන්දරු උපතකට වඩා වැඩි වන සෑම දරු උපතක් සඳහාම මාසිකව රු. 1,000/- බැගින් | |

03 ඒ අනුව 2018 ජනවාරි සිට නිවුන් දරු ආධාර මුදල ඉහත පරිදි වැඩිකර ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. උතුරු මැද පළාත් සභාවේ 2017/08 අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 2017/56 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ඊ.පී.ජී.සී.කේ.වඩුගල්ල,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
උතුරු මැද පළාත.

ඊ.පී.ජී.සී.කේ. වඩුගල්ල
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත